සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – Second Term Test – July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 6 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time : 2 hours**

## Islam
ඉස්ලාම්

Name :- .................................................... Grade : -................ Index number:-....................

### I කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. අල්ලාහ්ට සමාන තබන්නන් හඳුන්වන පදය,
   (i) මුස්ලිම්වරු (ii) මුෂ්රික්වරු (iii) මුඃමින්වරු (iv) මුර්තද්වරු

2. ඉස්ලාමීය වගකීම් අතරින් අවසාන වගකීම
   (i) සලාතය (ii) උපවාසය (iii) හජ් (iv) zසකාත්

3. පහත කරුණු වලින් සාමාන්‍ය නජීස් නොවන්නේ,
   (i) මිය ගිය ජීවීන් (ii) මුත්‍රා
   (iii) මළපහ (iv) බල්ලාගේ මළපහ

4. හදීස් අනුව අපට ආලෝකයක් ලෙස ද සාක්ෂියක් ලෙස ද පරලොව විමුක්තිය ලෙස ද පවතින ඉබාදතය වන්නේ,
   (i) උපවාසය (ii) සලාතය (iii) හජ් (iv) zසකාත්

5. ''ලෙයිලතුල් කද්ර්'' රාත්‍රිය දක්නට ලැබෙන මාසය,
   (i) රමළාන් මාසය (ii) ෂව්වාල් මාසය
   (iii) මුහර්රම් මාසය (iv) රජබ් මාසය

6. ''මුතබයිහිකුන්'' යයි අමතනු ලබන්නේ,
   (i) බොරු කියන්නන් (ii) පුරසාරම් දොඩවන්නන්
   (iii) කේලම් කියන්නන් (iv) ඕපා දූප කතා කරන්නන්

7. ''මුහාජිරින් වරු'' යනු,
   (i) මක්කාවාසීන්
   (ii) මක්කාවේ සිට තම ගෙවල් දොරවල් අතහැර මදීනාවට පැමිණි අය
   (iii) මදීනාවාසීන්
   (iv) මුස්ලිම්වරුන්

8. අල් කුර්ආනයේ 96 වන සූරාව,
   (i) සූරා ඉඃලාස් (ii) සූරතුල් අලක් (iii) සූරතුල් ෆාතිහා (iv) සූරතුල් ෆීල්

9. කඃබතුල්ලාහ්වට ඊර්ෂ්‍යා කර එය විනාශ කිරීමට පැමිණි රජතුමා
   (i) නජ්ජාසි රජ (ii) ආබ්රහා රජ (iii) ඇබීසීනියා රජ (iv) රෝම අධිරාජ්‍යයා

10. අල්ලාහ්ට කීකරු වූ මුස්ලිම්වරයකු දෙවනුව සැලකිය යුත්තේ,
   (i) කුඩා දරුවන්ට (ii) අසල්වාසීන්ට (iii) නෑදෑයන්ට (iv) දෙමව්පියන්ට

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

➢ **හිස්තැන් පුරවන්න.**

11. අල් කුර්ආනය වසර .......................... ක් පුරා පහළ විය.

12. ඔබ අතරින් එක් කෙනෙක් තමා කැමති දේ තම සහෝදරයාට ද කැමැති වන තෙක් ඔබගෙන් කිසිවකු සැබෑ ............................. නොවන්නේය. (මුගාරි මුස්ලිම්)

13. ''තම දෙමව්පියන් තෘප්තිමත් කළ පුද්ගලයා අල්ලාහ් ......................... කළ අයෙක් වන්නේය. (බුහාරි)

14. කට තලතා සේදීම, නාස් පුඩු සේදීම හා ...................... ආදිය වුළූහි සුන්නත් වේ.

15. ෂෙයිතාන්ගේ නායකයා .................... වන්නේය.

➢ **යා කරන්න.**

| | | | |
|---|---|---|---|
| 16. | සලාතයේ ෆර්ලු | • | 6කි |
| 17. | පළමු සලාම් කීම | • | මුබ්තිලාත් වේ. |
| 18. | වුළූ හි ෆර්ලු | • | 19 කි. |
| 19. | වජ්ජහ්තු පාරායනය | • | ෆර්ලු |
| 20. | සලාතය බිඳවන කරුණු | • | සුන්නත් වේ. |

(20 × 2 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**
- **පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් ද අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 11 බැගින් ද හිමි වේ.**

1. (i) ජබ්රීල් (අලෛ) තුමාගේ සුවිශේෂ නම් දෙකක් ලියන්න.
 (ii) ඉස්ලාම් යන වචනයට සිංහල තේරුම් දෙකක් ලියන්න.
 (iii) අල් මාඋත් තහූර් යන ජල වර්ගය සඳහා උදාහරණ දෙකක් ලියන්න.
 (iv) කුල් හුවල්ලාහු අහද්, අල්ලාහුස් සමද්, ලම් යලිද්, ................................ යන සූරාවට කියන නම කුමක්ද?
 (v) ''ආමන්තු බිල්ලාහ්'' යනු කුමක්ද?
 (vi) සූරතුල් ඉඃ ලාස් සඳහා කියන තවත් නම් දෙකක් ලියන්න.
 (vii) ජින්වරු හා මිනිසා අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.
 (viii) කබ්ර් වල තුළ දී ප්‍රශ්න අසන මලාඉකාවරු දෙදෙනා කවුද?

(2 × 8 = 16)

2. (i) සලාතයේ වැදගත්කම පිළිබඳව හදීසයක් ලියන්න.
 (ii) වුළූ හි මුබ්තිලාත් දෙකක් ලියන්න.
 (iiii) වුළූ හි ෆර්ලු 5ක් ලියන්න.

(2 + 4 + 5)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

3. (i) පාපී ක්‍රියාවන්ගෙන් අපව ආරක්ෂා කර ගන්නා පලිහ ලෙස නබි (සල්) තුමා සඳහන් කළ ඉබාදතය කුමක්ද?

(ii) අල් කුර්ආනයට අනුව අප දෙමව්පියන් වෙනුවෙන් ප්‍රාර්ථනා කළ යුතු ආකාරය ලියන්න.

(iiii) දෙමව්පියන්ට කළ යුතු උපකාර 5ක් ලියන්න.

(2 + 4 + 5)

4. (i) ඉස්ලාම් පෙන්වා දෙන පරිදි නිවසකට ඇතුළු වීමට අවසර ලබා ගත යුතු ආකාර දෙකක් ලියන්න.

(ii) මිඃ රාජ් ගමනේ දී නබි (සල්) තුමාණන් නිරයේ දී දුටු සිදුවීමක් ලියන්න.

(iiii) අප අල් කුර්ආනය සාරායනය කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු පහක් ලියන්න.

(2 + 4 + 5)

5. (i) උපවාසයේ ෆර්ලු දෙක කුමක්ද?

(ii) ජින්වරු පිළිබඳව ඔබ දන්නා කරුණු 4ක් ලියන්න.

(iiii) රමළාන් මාසයේ කළ යුතු යැයි ඉස්ලාම් අපට පෙන්වා දෙන කරුණු 5ක් ලියන්න.

(2 + 4 + 5)

6. (i) ඉස්ලාමය පිළිගන්නා විට පැවසිය යුත්තේ කී වන කලීමාව ද?

(ii) පහත වචන වල තේරුම ලියන්න.

- තව්හීද්
- රිසාලත්
- මආද්
- කාරි කුර්රා

(iiii) පළමුවන, දෙවන හා තුන්වන යන කලීමා තුන සිංහලෙන් ලියන්න.

(2 + 4 + 5)